ප්‍රසම්පාදන දැන්වීම

ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

බේරුවල ධීවර වරායෙහි ෆයිබර්ග්ලාස් කැබලි කිරීමේ යන්ත්‍රයක් ස්ථාපනය කිරීම සඳහා යෝජිත වානේ ගොඩනැගිල්ල සැලසුම් කිරීම, ඉදිකිරීම, නිම කිරීම සහ ක්‍රියාත්මක කරවීම. (නැවත ලංසු කැඳවීම)

කොන්ත්‍රාත් අංකය : CFHC/PD/PSD/BRU/2026-103-I

1. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් ඉහත සඳහන් කාර්යය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙම කාර්යයට ඉවතලන ෆයිබර් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍රාගාරයක් (ෆයිබර්ග්ලාස් බෝට්ටු සහ අලුත්වැඩියා අපද්‍රව්‍ය සිහින් කුඩු බවට පත්කිරීමේ) සඳහා වානේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම ඇතුළත් වේ. ලංසුකරුගේ කාර්ය පරාසය අනාගතයේ දී යන්ත්‍රෝපකරණ සවි කිරීම සඳහා අවශ්‍ය වානේ සැකිල්ල ඉදිකිරීමට සහ ඊට අදාළ සිවිල් කටයුතු සඳහා පමණක් තදින්ම සීමා වේ. ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රමය මගින් ලංසු කැඳවේ.
2. CIDA ලියාපදිංචිය අවශ්‍ය වේ:

   විශේෂත්වය: ගොඩනැගිලි ඉදිකිරීම් හෝ EM (දැඩි වානේ නිර්මාණ)

   ශ්‍රේණිය: C5, C4, C3 හෝ EM 3 හෝ ඊට ඉහළ (CIDA ලියාපදිංචිය ලංසු විවෘත කරන දිනය දක්වා වලංගු විය යුතුය)
3. නැවත නොගෙවනු ලබන **රු. 8,000.00 ක** ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ප්‍රසම්පාදන කළමනාකරු වෙත ආයතනික ලිපි ශීර්ෂයක් යටතේ කරනු ලබන ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් **2026.10.27 සිට 2026.11.16** දක්වා ඕනෑම වැඩකරන දිනක **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා, උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. මුදු, තැබූ ලංසු **2026.11.17** වන දින **පෙ.ව. 11.00 ට** විවෘත කරනු ලැබේ.
4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට සම්පූර්ණ විස්තර (ලංසු කැඳවීම – IFB) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නිල වෙබ් අඩවියෙන් (**www.cfhc.gov.lk** හි **procurement** ටැබ් එක යටතේ) සහ **www.promise.lk** වෙතින් ලබා ගත හැක.
5. වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, කරුණාකර **011-2525063** දුරකථන අංකය ඔස්සේ වැඩබලන ප්‍රසම්පාදන කළමනාකාර අමතන්න.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15, රොක් හවුස් පටුමග,
කොළඹ 15.